සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

**නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02යි.**

<u>I කොටස</u>

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 06 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පාසල් සංවිධාන ව්‍යුහය තුළ පවතින ඉහළම තනතුර කුමක්ද?
1) විදුහල්පති 2) ගුරුවරයා 3) නියෝජ්‍ය විදුහල්පති 4) ප්‍රධාන ශිෂ්‍ය නායක

(02) ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ආරම්භ කිරීම සඳහා විශාල මෙහෙවරක් ඉටුකළ ප්‍රථම අධ්‍යාපන ඇමතිවරයා වන්නේ,
1) ඩී.එස්.සේනානායක මහතා ය. 2) ලලිත් ඇතුළත් මුදලි මහතා ය.
3) එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා ය. 4) සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා ය.

(03) සැලසුම් සහගත නොවන ශිෂ්‍යයෙකු තුළ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1) පහසුවෙන් අභියෝග ජය ගැනීම. 2) කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම.
3) ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල යෙදීම. 4) ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම.

(04) පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය වඩාත් හොඳින් සිසු හදවත් තුළ ජනිත කර වීමට සමත් වන්නේ මින් කවරක්ද?
1) පාසල් කොඩිය 2) පාසල් ගීතය 3) පාසල් සම්ප්‍රදාය 4) පාසල් ලාංඡනය

(05) ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝගයට මුහුණ දුන් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූ බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,
1) කොළඹ,ගම්පහ සහ කළුතර ය. 2) ගම්පහ,රත්නපුර සහ කෑගල්ල ය.
3) බදුල්ල,අම්පාර සහ මොණරාගල ය. 4) කළුතර,ගම්පහ සහ මහනුවර ය.

(06) පාසලෙන් සමාජයට සැපයෙන සේවාවක් නොවන්නේ,
1) යහපත් පුරවැසියන් බිහි කිරීම. 2) අනාගත නායකයන් පුහුණු කිරීම.
3) ප්‍රජාවට පණිවිඩ ලබා දීම. 4) පාසල සතු දේපළ ආරක්ෂා කිරීම.

(ලකුණු 2×6=12)

- **I තීරුවේ සඳහන් පද හා සම්බන්ධ ප්‍රකාශ II තීරුවෙන් නිවැරදිව තෝරා යා කරන්න.**

| | I තීරුව | II තීරුව |
|---|---|---|
| (07) | මානව සම්පත | A ලාභ අපේක්ෂාවෙන් තොරව රජය සපයයි |
| (08) | අධ්‍යාපනය | B මිනිසාගේ මැදිහත් වීමෙන් තොරව නිර්මාණය වේ |
| (09) | පොදු දේපල | C යහපත් ජීවිතයට අවස්ථා උදා කරයි |
| (10) | භෞතික පරිසරය | D කායික හා බුද්ධිමය හැකියා දියුණු වීමෙන් බිහි වේ |

(ලකුණු 2×4=8)

LIVEWORKSHEETS

- **11 - 15 තෙක් දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(11) ඇම්බැක්ක දේවාලය දේශීය ලී කැටයම් විදහා දක්වන අගනා සංස්කෘතික උරුමයකි ( )

(12) ග්‍රාම නිලධාරී සහතිකය අනුමත කරවා ගැනීමට යා යුතු වන්නේ ප්‍රාදේශීය සභාවටයි ( )

(13) මහනගර සභාවක ප්‍රධානියා වන්නේ සභාපතිය ( )

(14) පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තුවන අරමුණ ''දැක්ම'' තුළින් ප්‍රකාශ වේ ( )

(15) සාකච්ඡා මගින් එකගතාවන්ට එළඹෙමින් කටයුතු කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතුවේ ( )

(ලකුණු 2×5=10)

- **16 - 20 තෙක් දී ඇති වාක්‍යවල හිස්තැනට නිවැරදි පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

(16) රාජ්‍ය ඔසුසල බිහි කිරීමට පුරෝගාමීව කටයුතු කළ .......................................... මහතාගේ ඖෂධ ප්‍රතිපත්තිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවධානයට ද ලක් විය.

(17) වායු ගෝලය දූෂණය වීමෙන්.................................... ස්ථරයට හානි සිදු වේ.

(18) පුද්ගලයින්ගේ බාහිර හැසිරීම පාලනය සඳහා රජය විසින් පනවා ඇති කොන්දේසි .....................................නම් වේ.

(19) නීතිය හා සාමය ආරක්‍ෂා කරමින් ප්‍රදේශයේ අපරාධ වැළැක්වීම සඳහා සහාය වන රාජ්‍ය ආයතනය වන්නේ ........................................... යි.

(20) ඉතිහාසය පිළිබඳ දැනුම ලබා ගැනීමට උපකාරී වන සියලු දෑ ...........................................යන පොදු නාමයෙන් හැඳින්වේ.

(ලකුණු 2×5=10)



LIVEWORKSHEETS